# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 3 දරන රජයේ ඉඩම් ආපසු ලබා ගැනීමේ (අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය) පනත

[සහතිකය සටහන් කළේ 1975 පෙබරවාරි මස 4 වන දින]

---

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 පෙබරවාරි මස 21 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 3 දරන රජයේ ඉඩම් ආපසු ලබා ගැනීමේ (අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය) පනත

[සහතිකය සටහන් කළේ 1975 පෙබරවාරි මස 4 වන දින]

එල්. ඩී.—ඕ. 32/74

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය විසින් අන්සතු කරන ලද ඉඩම් ඇතැම් අවස්ථානුගත තත්ත්වයන් යටතේ රජය විසින් ආපසු ලබා ගත හැකි කරවීම පිණිසත් එයට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහාත් වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 3 දරන රජයේ ඉඩම් ආපසු ලබා ගැනීමේ (අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය විසින් අන්සතු කරනු ලැබූ ඉඩම් ඇතැම් අවස්ථානුගත තත්ත්වයන් යටතේ රජය සතු කිරීම.

2. (1) මෙහි මින් මතු '' මණ්ඩලය '' යනුවෙන් සඳහන් කරනු ලබන අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ බල ප්‍රදේශය තුළ වූ යම් ඉඩමක් කර්මාන්ත, වෙළෙඳ ව්‍යාපාර, නිවාස හෝ වාණිජ සංවර්ධන කාර්යය සඳහා 1973 ජූලි මස 17 වන දිනට පෙර මණ්ඩලය විසින් යම් තැනැත්තකු වෙත අන්සතු කරනු ලැබ තිබෙන්නා වූ හා මණ්ඩලය විසින් අනුමත කරන ලද සැලැස්මකට අනුකූලව 1974 ජූලි මස 17 වන දින හෝ ඊට පෙර එම ඉඩමෙහි කිසිම ස්ථිර ගොඩනැගිල්ලක් තැනීම ආරම්භ කර නොමැති බවට දිසාපතිවරයා සෑහීමට පත් වන්නා වූ අවස්ථාවක, දිසාපතිවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන සතු කිරීමේ නියමයකින්, එම නියමයෙහි සඳහන් දින සිට එම ඉඩම රජය සතු කළ යුතු ය.

(2) මණ්ඩලයේ බල ප්‍රදේශය තුළ වූ යම් ඉඩමක් යම් කර්මාන්ත, වෙළෙඳ ව්‍යාපාර, නිවාස හෝ වාණිජ සංවර්ධනයක් සඳහා 1973 ජූලි මස 17 වන දින හෝ ඊට පසු මණ්ඩලය විසින් යම් තැනැත්තකු වෙත අන්සතු කරනු ලැබ තිබෙන්නා වූ හා මණ්ඩලය විසින් අනුමත කරන ලද සැලැස්මට අනුකූලව එම ඉඩමෙහි කිසිම ස්ථිර ගොඩනැගිල්ලක් තැනීම ඒ අන්සතු කිරීමේ දිනයේ සිට අවුරුද්දක් ගතවීමට පෙර ආරම්භ කර නොමැති බවට දිසාපතිවරයා සෑහීමට පත් වන්නා වූ අවස්ථාවක, දිසාපතිවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන සතු කිරීමේ නියමයකින්, එම නියමයෙහි සඳහන් දින සිට එම ඉඩම රජය සතු කළ යුතු ය.

සතු කිරීමේ නියමයේ නීතියේ බලපෑම.

3. (1) 2 වන වගන්තිය යටතේ කරන ලද සතු කිරීමේ නියමයක එම ඉඩම සියලු බැඳීම්වලින් තොරව රජය සතු කිරීමේ බලපෑම ඇත්තේ ය.

(2) 2 වන වගන්තිය යටතේ කරන ලද සතු කිරීමේ නියමයක් ප්‍රකාර යම් ඉඩමක් රජය සතු වූ අවස්ථාවක ඒ ඉඩම කෙරෙහි වූ යම් සම්බන්ධතාවක් ඇති කිසිම තැනැත්තකු රජයට විරුද්ධව හෝ රජය විසින් එම ඉඩම පසුව අන්සතු කරනු ලබන යම් තැනැත්තකුට විරුද්ධව ඒ සම්බන්ධතාව පිළිබඳ වූ ස්වකීය අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ හිමිකම නොලැබිය යුතු ය.

(3) 2 වන වගන්තිය යටතේ කරන ලද සතු කිරීමේ නියමයක් කිසිම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

ඡ 11390—8947 (75/01)

සතු කිරීමේ නියමය භාර දීම සහ අන්සතු කරන ලද ඉඩමෙහි සන්තකය භාර ගැනීම.

4. (1) 2 වන වගන්තිය යටතේ කරන ලද සතු කිරීමේ නියමයෙහි පිටපතක් මණ්ඩලය විසින් ඉඩම අන්සතු කරනු ලැබ සිටි තැනැත්තාට භාර දීමෙන් හෝ ඔහු සොයා ගත නොහැකි අවස්ථාවක එම ඉඩමෙහි පදිංචිව සිටින තැනැත්තාට භාර දීමෙන් හෝ එම ඉඩමෙහි කිසිම තැනැත්තකු පදිංචිව නොසිටින අවස්ථාවක එම ඉඩමේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ඒ පිටපත ඇලවීමෙන් හෝ භාර දෙනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ නියමිත පරිදි සතු කිරීමේ නියමයක පිටපත භාර දෙනු ලැබූ විට, මණ්ඩලය විසින් එම ඉඩම අන්සතු කරනු ලැබ සිටි තැනැත්තා විසින් හෝ වෙන යම් තැනැත්තකු එම ඉඩමෙහි පදිංචිව සිටින අවස්ථාවක ඒ වෙනත් තැනැත්තා විසින් හෝ ඒ භාර දීමේ දින සිට දින තිහක කාලයක් ඇතුළත, එම ඉඩමෙහි කනා ඇති යම් තාවකාලික ඉදි කිරීමක් වේ නම් එය ඉවත් කොට එම ඉඩම අත්හැර යා යුතු ය.

(3) මණ්ඩලය විසින් ඉඩම අන්සතු කරනු ලැබ සිටි තැනැත්තා හෝ එම ඉඩමෙහි පදිංචිව සිටින තැනැත්තා ඉහත කී දින තිහේ කාලය ඇතුළත ඒ ඉඩම අත්හැර යෑම පැහැර හරින අවස්ථාවක, දිසාපතිවරයා තමාම එම ඉඩමට ඇතුළු වී හෝ තමා විසින් බලය දෙනු ලැබූ යම් නිලධර යන්ගේ මාර්ගයෙන් එම ඉඩමට ඇතුළු වී හෝ එම ඉඩමෙහි සන්තකය භාර ගත හැකි ය. ඒ ඉඩමේ සන්තකය භාර ගැනීමේ කාර්යය සඳහා පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ සහාය ඉල්ලීම අවශ්‍ය යයි දිසාපති වරයා හෝ ඒ නිලධරයන් හෝ සලකතහොත් දිසාපතිවරයා හෝ එම නිලධරයන් හෝ විසින් එම සහාය ඉල්ලා සිටිය හැකි ය.

අවහිර කිරීම වරදක් වන බව.

5. ඒ ඉඩමෙහි සන්තකය භාර ගැනීමට දිසාපතිවරයා හෝ යම් නිලධරයන් හෝ උත්සාහ දැරීමේ දී කවර ආකාරයකින් හෝ ඔහුට හෝ ඔවුන්ට අවහිර කරන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත් වරයකු විසින් පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ඒ තැනැත්තා රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

මේ පනත සංගමවලට හෝ මණ්ඩලවලට අදාළ නොවන බව.

6. සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද හෝ යම් සංගමයකට හෝ පුද්ගල මණ්ඩලයකට හෝ මණ්ඩලය විසින් ඉඩම් අන්සතු කර දෙනු ලැබ ඇති අවස්ථාවක, මේ පනතෙහි විධිවිධාන අදාළ නොවන්නේ ය.

මේ පනත වෙනත් නීති අභිභවා බලපැවැත්විය යුතු බව.

7. මේ පනතේ විධිවිධාන වෙනත් නීතියක විධිවිධාන හා ගැටෙන හෝ ඊට අනුකූල නොවන අවස්ථාවක, මේ පනතේ විධිවිධාන ඒ නීතියේ විධිවිධාන අභිභවා බලපැවැත්විය යුතු ය.

8. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය" යන්නෙන් 1961 අංක 32 දරන අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල පනතින් පිහිටුවන ලද අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය අදහස් වේ ;

"අන්සතු කිරීම" යන්න එහි වෛයාකරන ප්‍රභේද හා සජාතීය යෙදුම් ද සමඟ ගත් විට—

(i) යම් හිමිකර දීමක්, පැවරීමක්, ප්‍රදානය කිරීමක්, බදු දීමක් හෝ කවරාකාර වූ හෝ වෙන යම් බැහැර කිරීමක්, සහ

(ii) අදහස් කරන ලද, යෝජිත හෝ අභිප්‍රේත යම් හිමිකර දීමක්, පැවරීමක්, ප්‍රදානය කිරීමක්, බදු දීමක් හෝ කවරාකාර වූ හෝ වෙන යම් බැහැර කිරීමක් යටතේ සන්තකය පැවරීම

ඊට ඇතුළත් වේ ;

"ගොඩනැගිල්ල" යන්නට මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් සැලැස්මකට අනුකූලව ඉදි කරන ලද ස්ථිර ස්වභාවයෙන් යුත් යම් අත්තිවාරමක් හෝ ව්‍යුහයක් ඇතුළත් වේ ;

"දිසාපතිවරයා" යන්නෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා අදහස් වන අතර ඒ දිස්ත්‍රික්කයේ අතිරේක හෝ සහකාර දිසාපතිවරයෙක් ද ඊට ඇතුළත් වේ.